සී/සහිත ලංකා රාජ්‍ය තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සැපයීමේ (පුද්ගලික) සමාගමේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. සමාගමේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. 2016 හා 2017 සමාගමේ ඒකාබද්ධ ගණුදෙනු පිළිබඳ වාර්තාව සමාගමේ සභාපති වෙත 2018 නොවැම්බර් 13 දින නිකුත් කරන ලදී. 2016 විස්තරාත්මක වාර්තාව සමාගමේ සභාපති වෙත 2019 දෙසැම්බර් 18 දින නිකුත් කරන ලදී. සමාගමේ ගනුදෙනු පිළිබඳ වාර්තාව 2019 පෙබරවාරි 22 දින පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කරයි.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම
-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම
---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.
මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාලවන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 මතය ව්‍යාවනය සඳහා පදනම

---------------------------------

(අ) සමාගම විසින් ගැලපුම් සිදුකිරීමේදී නියමිත පරිදි ගිණුම්කරණ සටහන් තබා ගැනීමකින් තොරව, සෘජුවම ශේෂ පිරික්සුමට ගැලපුම් සිදු කර තිබුණි. තවදුරටත් සඳහන් කරන විට දේපල පිරියත හා උපකරණ, ක්ෂය සඳහා ප්‍රතිපාදන , ප්‍රදාන වත්කම් සඳහා වූ විලම්බිත ආදායම් සහ උපචිත වියදම් සඳහා ලෙජර ගිණුම් නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන වලට අනුව 2016 ජනවාරි 01 දිනට සමාගමේ දේපල පිරියත හා උපකරණ වල පිරිවැය රු.77,340,402ක් විය. එසේ වුවද ස්ථාවර වත්කම් ලේඛනය සහ විස්තරාත්මක උපලේඛන සමාගම විසින් පවත්වා නොගැනීම නිසා එම ශේෂයෙහි නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය. තවදුරටත් සමාලෝචිත වර්ෂය සඳහා දේපල පිරියත හා උපකරණ සම්බන්ධයෙන් භෞතික සත්‍යාපනයක් සිදු කර නොතිබුණි.

(ඇ) සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අනුව, ක්ෂය වෙන්කිරීම සිදුකළ යුත්තේ හීන වන ශේෂ ක්‍රමයට වුවද, ක්ෂය ගණනය කිරීම සරල මාර්ග ක්‍රමය පදනම් කරගෙන සිදුකර තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 63 ඡේදය අනුව හානිකරණ අලාභ හඳුනා ගත යුතුය. කෙසේ වෙතත් සමාගම විසින් දේපල පිරියත හා උපකරණ සඳහා හානිකරණ පරීක්ෂණයක් සිදු කර ඒ අනුව අවශ්‍ය ගිණුම්කරණ පිළියම් සිදු කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 හි 55 ඡේදයට පටහැනිව, පාරිතෝෂිත දීමනා සඳහා බැදීම වූ රු.1,355,000 සමාගම විසින් ගණනය කිරීමේදී සම්පූර්ණ කළ සේවා වර්ෂ ගණන සඳහා සමාලෝචිත මූල්‍ය වර්ෂයේ දෙසැම්බර් මස වැටුපෙන් මාස භාගයක වැටුප පදනම් කර ගෙන තිබුණි.

(ඊ) මූල්‍ය ප්‍රකාශන වල පෙන්නුම් කරන, ගැලපීම් කරන ලද ගැලපුම් තුනක් වූ ලියා හරින ලද සහ නැවත ලියන ලද ශේෂයන්, ප්‍රදාන වත්කම් සඳහා විලම්බිත වගකීම, දේපල පිරියත සහ උපකරණ සඳහා සමුච්චිත ක්ෂය ඇතුළුව එකතුව රු. 55,965,516 ක් මූලික වැරදි / පෙර වර්ෂ වල ගැලපුම් වල නිරවද්‍යතාව, ගැලපුම් කරන ලද ශේෂයන්, ගැලපීම් සඳහා හේතූන් සහ ගැලපුම් සඳහා අනුමැතිය යන තොරතුරු නොමැති වීම නිසා විගණනයේදී තහවුරු කරගැනීමට නොහැකි විය.

(උ) කිසිදු අනුමැතියකින් තොරව, සියළුම සේවකයින්ට රු.15,000 ක් බැගින් වූ මාසික ගමන් වියදම් දීමනාවක් සමාගම විසින් ගෙවා තිබුණි. ගෙවීම් තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය සඳහා ගමන් වියදම් දීමනාව රු.1,260,000 ක් විය යුතුය. කෙසේ වෙතත් , මූල්‍ය ප්‍රකාශ අනුව එය රු.555,000ක් විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සමාලෝචිත වර්ෂය සඳහා වියදම රු.705,000 කින් ඌන ගණනය වී ඇත.

(ඌ) ප්‍රදාන ලැබීම් සම්බන්ධයෙන් තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණු බැවින් ප්‍රදාන වත්කම් සඳහා වූ විලම්භිත වගකීමේ 2016 දෙසැම්බර් 31 ශේෂය වන රු. 4,199,121 සහ රු. 19,335,101ක අගයක් ආදායම් ප්‍රකාශයට මාරු කිරීමේ පදනමෙහි නිරවද්‍යතාවය විගණනයේදී සත්‍යාපනය කරගැනීමට නොහැකි විය.

2. මූල්‍ය ප්‍රකාශ
--------------

2.1 මතය ව්‍යාවනය
------------------

මෙම වාර්තාවේ මතය ව්‍යාවනය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොටගෙන, මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

2.2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව
-----------------------------------------------------------------

2007 අංක 07 දරණ සමාගම් පනතේ 163(2) වගන්තිය මඟින් නියම කරන පරිදි මම පහත සඳහන් කරුණු ප්‍රකාශ කරමි.

(අ) මතය සඳහා පදනම හා විෂය පථය සහ සීමාවන් ඉහතින් ප්‍රකාශ කළ පරිදි වේ.

(ආ) මා දරන්නා වූ මතය:

- විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි වූ අතර මාගේ පරීක්ෂාවෙන් පෙනෙන පරිදි නිසි ගිණුම් වාර්තා සමාගම විසින් තබා නොමැත.

- සමාගම 2013 වර්ෂයේ සිට වාර්ෂික වාර්තා සමාගම් රෙජිස්ටාර් සමග ගොණුගත කර නොතිබීම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියේ දැක්වෙන අවශ්‍යතාවන් හා අනුකූල බව මා දරන්නා වූ මතය වේ.